ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2513/28 - 2026 නොවැම්බර් මස 04 වැනි බදාදා - 2026.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ
දමන ප්‍රාදේශීය සභාවේ
සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන දමන ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ දමන ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ ජිනදාස ඩයස් සංදීපා සෙවිමිණි විජේගුණවර්ධන මහත්මිය අයත් වන්නා වූ සමගි ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම දමන ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මාර්තුංගා ආරච්චිලාගේ සඳුනී නිමේෂා මහත්මිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

දමන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, අත්තනායක මුදියන්සේලාගේ කසුන් ශ්‍රීනාත් අත්තනායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් මාර්තුංගා ආරච්චිලාගේ සඳුනී නිමේෂා මහත්මිය, දමන ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

කසුන් ශ්‍රීනාත් අත්තනායක,
තේරීම්භාර නිලධාරි,
දමන ප්‍රාදේශීය සභාව.

2026 ක් වූ නොවැම්බර් මස 04 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය.
අම්පාර.

EOG 11 - 0029